# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 22 දරන
# මැලතියොන් පාලන පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 21 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 ජූනි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 90 යි | තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 22 දරන මැලතියොන් පාලන පනත

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 21 වන දින.]

එල්. ඞී.—ඕ. 36/79.

**බලය නොලත් පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාව තුළ මැලතියොන් සන්තකයේ තබාගනු ලැබීම, ප්‍රවාහනය කරනු ලැබීම, විකුණනු ලැබීම හා පාවිච්චි කරනු ලැබීම තහනම් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1985 අංක 22 දරන මැලතියොන් පාලන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

මැලතියොන් ආනයනය කිරීම සඳහා එකම බලධරයා.

2. (මෙහි මින් මතු "අධ්‍යක්ෂජනරාල්වරයා" යයි කියනු ලබන) තත් කාලයෙහි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂජනරාල්වරයා මඟින් ක්‍රියා කරන රජය (මෙහි මින් මතු "කෘමිනාශකය" යයි කියනු ලබන) මැලතියොන් ආනයනය කිරීම සඳහා එකම බලධරයා විය යුතු ය.

කෘමිනාශකය සන්තකයෙහි තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හා පාවිච්චි කිරීම කෙරෙහි සීමා පැනවීම.

3. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මැලේරියා මර්දන ව්‍යාපාරයේ කාර්ය සඳහා අධ්‍යක්ෂජනරාල්වරයා විසින් ලියවිල්ලකින් නිසි පරිදි බලය දෙන ලද තැනැත්තන් හැර කිසිදු තැනැත්තකු විසින් කෘමිනාශකය සන්තකයෙහි තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ පාවිච්චි කිරීම කරනු නොලැබිය යුතු ය.

පනතේ කාර්ය පරිපාලනය.

4. (1) අධ්‍යක්ෂජනරාල්වරයා, මේ පනතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන්නේ නම් මිස, මේ පනතේ සාමාන්‍ය කාර්ය පරිපාලනය භාරව සිටිය යුතු ය.

(2) අධ්‍යක්ෂජනරාල්වරයා විසින්, මේ පනතේ සියලු විධිවිධාන හෝ විධිවිධාන අතුරින් කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග ක්‍රියාවේ යෙදවීම හෝ බලගැන්වීම සම්බන්ධයෙන්, අවශ්‍යයයි ඔහු සලකන විධානයන් තුම දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට දිය හැකි අතර, විධාන එසේ දෙනු ලැබූ ඒ සෑම නිලධරයකුම ඒ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(3) අධ්‍යක්ෂජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මේ පනත යටතේ ඔහුට ඇති සියලු බලතල, කාර්ය හෝ කර්තව්‍ය නැතහොත් ඒවායින් කිසිවක් නමින් හෝ ධුරයෙන් යම් යටත් නිලධරයකුට පැවරිය හැකි අතර එවැනි බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් එසේ පවරනු ලැබුවේ යම් නිලධරයකුට ද ඒ නිලධරයා විසින් අධ්‍යක්ෂජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම කළ යුතු ය.

බලය ලත් නිලධරයා.

5. මේ පනතේ කාර්ය සඳහා බලය ලත් නිලධරයකු ලෙස අධ්‍යක්ෂජනරාල්වරයා විසින් මැලේරියා මර්දන ව්‍යාපාරයේ යම් නිලධරයකු නම් කළ හැකි ය.

2—ඒ 083531—6,750 (85/04)

බලය ලත් නිලධරයාගේ බලතල.

6. (1) බලය ලත් නිලධරයකු විසින්, ඔහුගේ කාර්ය ඉටු කිරීම සඳහා සහ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා—

(අ) කෘමිනාශකය පිළියෙල කරනු ලබන බවට, අසුරනු ලබන බවට හෝ ගබඩා කර ඇති බවට ඔහු විශ්වාස කරන යම් ස්ථානය කට සාධාරණ වේලාවක දී ඇතුළුවීම සහ ඒවායේ සැම්පල පරීක්ෂා කිරීම සහ ලබා ගැනීම සහ එසේම කෘමිනාශකය පිළියෙළ කිරීම, ඇසිරීම හෝ ගබඩා කිරීම සඳහා පාවිච්චි කරනු ලබන්නේ යයි ඔහු විශ්වාස කරන යම් ද්‍රව්‍යයක්, මෙවලමක්, උපකරණයක් හෝ වෙනත් භාණ්ඩයක් පරීක්ෂා කිරීම ;

(ආ) කෘමිනාශකය ප්‍රවාහනය කරනු ලබන බවට ඔහු විශ්වාස කරන යම් වාහනයක් සෝදිසි කිරීමේ කාර්ය සඳහා නැවැත්වීම හෝ රඳවා තබා ගැනීම සහ කෘමිනාශකය සෝදිසි කිරීම, පරීක්ෂා කිරීම සහ කෘමිනාශකයෙහි සැම්පල ලබා ගැනීම ;

(ඇ) කෘමිනාශකය තබා ඇති බවට ඔහු විශ්වාස කරන යම් භාජන යක් හෝ ඇසුරුමක් විවෘත කිරීම සහ පරීක්ෂා කිරීම ; හෝ

(ඈ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක් කඩ කරනු ලැබ ඇත්තේ හෝ කඩ කරනු ලබන්නේ හෝ උල්ලංඝනය කරනු ලැබ ඇත්තේ හෝ උල්ලංඝනය කරනු ලබන්නේ යම් කෘමිනාශකයක් මගින් හෝ සම්බන්ධයෙන් යැයි ඔහු විශ්වාස කරන්නේ ද, ඒ කෘමිනාශකය අවශ්‍ය කාලයකට තහනමට ගැනීම සහ රඳවා තබා ගැනීම

කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ක්‍රියා කරන බලය ලත් නිලධරයකු ඔහුගේ අධිකාරය ඉදිරිපත් කළ යුතු යයි නියම කරනු ලැබුව හොත්, ඔහු එය ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ බලය ලත් නිලධරයකු ක්‍රියා කරන අවස්ථාවක දී, ඔහු විසින් හැකිතාක් ඉක්මණින් ඒ ක්‍රියාව පිළිබඳව අධ්‍යක්ෂජනරාල්වරයාට දැනුම් දිය යුතු අතර, ඒ ක්‍රියාව කිරීම පිළිබඳව හේතු දැක්විය යුතු ය.

(4) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ තමාගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා ක්‍රියා කරන යම් බලය ලත් නිලධරයකුට, කිසිදු තැනැත්තකු විසින් බාධා නොකළ යුතු ය.

(5) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ තමාගේ බලතල ක්‍රියාත්මක කිරීමේ යෙදී සිටින යම් බලය ලත් නිලධරයකුට, කිසිදු තැනැත්තකු විසින් දැන දැනම යම් අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ, වාචිකව හෝ ලියවිල්ලකින් නොකළ යුතු ය.

(6) බලය ලත් නිලධරයකු විසින් මේ පනත යටතේ තහනමට ගන්නා ලද කෘමිනාශකය, එම නිලධරයාගේ බලය නොමැතිව, කිසිදු තැනැත්තකු විසින් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් ඒ සම්බන්ධයෙන් කවර වූ හෝ මැදිහත් වීමක් නොකළ යුතු ය.

(7) මේ පනත යටතේ තහනමට ගන්නා ලද යම් කෘමිනාශක යක්, බලය ලත් නිලධරයාගේ මනාපය අනුව, ඒ කෘමිනාශකය තහනමට ගන්නා ලද ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ තැබීම නැතහොත් ගබඩා කිරීම හෝ තම අභිමතය පරිදි වෙනත් යම් ස්ථානයකට ඉවත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

7. (1) වරදක් සිදු කරනු ලැබ ඇත්තේ යම් කෘමිනාශකයක් සම්බන්ධයෙන් ද ඒ කෘමිනාශකය, මේ පනත යටතේ බලය ලත් නිලධරයකු විසින් තහනමට ගනු ලැබ මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ කඩකර ඇති බවට අධ්‍යක්ෂජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී සහ තහනමට ගනු ලැබූ අවස්ථාවේ දී ඒ කෘමිනාශකයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා, අධ්‍යක්ෂජනරාල්වරයා විසින් ඒ කෘමිනාශකය විනාශ කරනු ලැබීමට හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීමට, ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම්, අධ්‍යක්ෂජනරාල්වරයා විසින් විධානය කරනු ලබන ආකාරයට ඒ කෘමිනාශකය විනාශ කිරීම හෝ බැහැර කිරීම කළ හැකි ය. තහනමට ගන්නා ලද කෘමිනාශකය සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගය.

(2) කෘමිනාශකයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා කෘමිනාශකය විනාශ කිරීමට හෝ වෙනත් යම් ආකාරය කින් බැහැර කිරීමට ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ නොකරන අවස්ථාවක දී—

(අ) කෘමිනාශකයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා තමා එම කෘමිනාශකයේ සන්තකය දැරීමට, එය ප්‍රවාහනය කිරීමට, විකිණීමට හෝ පාවිච්චි කිරීමට බලය ලබා ඇති බවට අධ්‍යක්ෂජනරාල්වරයා සෑහීමට පත් කරයි නම්, අධ්‍යක්ෂජනරාල්වරයා විසින් කෘමිනාශ කය මුදා හැරිය යුතු ය; නැතහොත්

(ආ) කෘමිනාශකයේ සන්තකය දැරීමට, එය ප්‍රවාහනය කිරීමට, විකිණීමට හෝ පාවිච්චි කිරීමට තමා බලය ලබා ඇති බවට ඒ කෘමිනාශකයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා විසින් අධ්‍යක්ෂජනරාල්වරයා සෑහීමට පත් නොකරයි නම්, අධ්‍යක්ෂජනරාල්වරයා විසින්, කෘමිනාශ කයේ ඒ අයිතිකරුට හෝ එහි සන්තකය දරන තැනැත් තාට දැනුම් දී, තහනමට ගැනීම කරනු ලැබූ ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට වහාම දැනුම් දිය යුතු ය.

(3) (2) (ආ) උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයට තොරතුරු දන්වනු ලැබූ විට, ඒ අධිකරණය විසින්—

(අ) නඩු විභාගයෙන් පසු, මේ පනතේ විධිවිධාන යටතේ එම කෘමිනාශකයේ සන්තකය දැරීමට, එය විකිණීමට, ප්‍රවාහනය කිරීමට හෝ පාවිච්චි කිරීමට කෘමිනාශකයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා බලය ලබා නොමැති බව තීරණය කරනු ලැබුවහොත්, අධිකරණය විධානය කළ හැකි පරිදි බැහැර කිරීම සඳහා ඒ කෘමිනාශකය අහිමි කර අධ්‍යක්ෂජනරාල්වරයාට භාර දීමට ආඥා කළ යුතු ය ; නැතහොත්

(ආ) නඩු විභාගයෙන් පසු, මේ පනතේ විධිවිධාන යටතේ එම කෘමිනාශකයේ සන්තකය දැරීමට, එය විකිණීමට, ප්‍රවාහනය කිරීමට හෝ පාවිච්චි කිරීමට කෘමිනාශකයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා බලය ලබා ඇති බව තීරණය කරනු ලැබුවහොත් ඒ කෘමිනාශකය, එහි අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා වෙත මුදා හැරීමට ආඥා කළ යුතු ය.

විශ්ලේෂණය

8. (1) බලය ලත් නිලධරයකු විසින් තමා විසින් තහනමට ගන්නා ලද කෘමිනාශකය හෝ එහි යම් කොටසක් හෝ ඔහු විසින් ලබා ගන්නා ලද යම් සැම්පලයක්, 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විනාශ කරනු ලැබුවේ නම් මිස, විශ්ලේෂණය හෝ පරීක්ෂා කිරීම සඳහා, අනුමත කළ විශ්ලේෂක වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද කෘමිනාශකය අනුමත කළ විශ්ලේෂක විසින් විශ්ලේෂණයක් හෝ පරීක්ෂා කිරීමක් කර ඇති අවස්ථාවක දී තම පරීක්ෂණයේ හෝ විශ්ලේෂණයේ ප්‍රතිඵල දක්වනු සහතිකයක් හෝ වාර්තාවක් ඔහු විසින් අධ්‍යක්ෂජනරාල්වරයා වෙත නිකුත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "අනුමත කළ විශ්ලේෂක" යන්නට අතිරේක අනුමත කළ විශ්ලේෂකයකු ද ඇතුළත් වේ.

අනුමත කළ විශ්ලේෂක

9. (1) මේ පනතේ හෝ එය යටතේ සාදන ලද නියෝගවල කාර්ය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා අනුමත කළ විශ්ලේෂක විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ තමා විසින් ඉටු කිරීමට අවශ්‍ය වන කර්තව්‍ය ඉටු කිරීම පිණිස පළාත් පාලන ආයතනයක යම් පරිපාලන ප්‍රදේශයක් සඳහා අධ්‍යක්ෂජනරාල්වරයා විසින් ලියවිල්ලකින් අතිරේක අනුමත කළ විශ්ලේෂකයකු අනුමත කළ හැකි ය.

(3) කිසිදු තැනැත්තකු, නියමිත සුදුසුකම් ලබා ඇත්නම් මිස, අතිරේක අනුමත කළ විශ්ලේෂකයකු වශයෙන් අනුමත නොකළ යුතු ය.

**10.** 7 වන සහ 8 වන වගන්තිවල කාර්ය සඳහා කෘමිනාශකය සෑදීම සඳහා පාවිච්චි කරනු ලබන යම් ද්‍රව්‍යයක් කෘමිනාශකය යන්නට ඇතුළත් විය යුතු ය.

7 වන සහ 8 වන වගන්තිවල කාර්ය සඳහා කෘමිනාශකය සෑදීම සඳහා පාවිච්චි කරනු ලබන ද්‍රව්‍ය එයට ඇතුළත් විය යුතු බව.

**11.** මේ පනතේ විධිවිධාන අතුරින් කිසිවක් හෝ එය යටතේ සාදන ලද නියෝග කඩ කරන හෝ ඒවාට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**12.** මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම වරෙන්තුවක් නො මැතිව සිරභාරයට ගත හැකි අතර, මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ සෑම වරදක්ම මහේස් ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය යුතු ය.

චූදිතයා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකි බව සහ මහේස්ත්‍රාත් අධිකරණයක දී නඩු විභාග කළ හැකි බව.

**13.** (1) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් සඳහා—

නඩු කටයුතු පැවරීම.

(අ) බලය ලත් නිලධරයකු විසින් හැර ; සහ

(ආ) එම වරද සිදු කිරීම සොයාගත් දිනයේ සිට මාස හයක කාල සීමාවක් ඉකුත් වීමෙන් පසු

නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ යම් වරදක් සම්බන්ධ නඩු විභාගයේ යම් අවස්ථාවක දී චූදිතයා නොවන වෙනත් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ වූ යම් වරදක් සිදු කර ඇති බව අධිකරණයට පෙනී යන විට, (1) වන උපවගන්තියේ විධි විධානවල හෝ වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, ඒ තැනැත්තාට විරුද්ධව නඩු පවරා ඇති සේ නඩු විභාගය පවත්වා ගෙන යා හැකි අතර, ඒ කාර්යය සඳහා ඒ නඩු කටයුතුවල දී යම් චෝදනාවක් වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ ආදේශ කිරීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

**14.** (1) පරීක්ෂා කිරීම හෝ විශ්ලේෂණය කිරීම සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් කාරණයක් පිළිබඳව අනුමත කළ විශ්ලේෂකයකු හෝ අතිරේක අනුමත කළ විශ්ලේෂකයකු විසින් අත්සන් තබන ලද, වාර්තාවක් හෝ සහතිකයක් බවට අදහස් කෙරෙන ලේඛනයක්, ඒ ලේඛනයේ සඳහන් කරුණු එසේ නොවන බවට ඔප්පු කළහොත් මිස, ඒ කරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන ඔප්පු කිරීමක් විය යුතු ය.

අනුමත කළ විශ්ලේෂකගේ හෝ අතිරේක අනුමත කළ විශ්ලේෂකගේ වාර්තාව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කොට ඇත්තේ යම් පාර්ශ්වයකට විරුද්ධව ද ඒ පාර්ශ්වය, අවස්ථාවෝචිත පරිදි, අනුමත කළ විශ්ලේෂක හෝ අතිරේක අනුමත කළ විශ්ලේෂක හෝ හරස් ප්‍රශ්න ඇසීම සඳහා කැඳවන ලෙස ඉල්ලා සිටින අවස්ථාවක දී අධිකරණය විසින් ඔහු කැඳවිය යුතු ය:

එසේ වුව ද, ඒ සාක්ෂිකරු කැඳවනු ලැබ ඇත්තේ සෑහෙන හේතු නොමැතිව බව අධිකරණයේ මතය වේ නම් ඔහු කැඳවීමේ ගාස්තු අධිකරණය වෙත ගෙවීමට ඒ ඉල්ලීම කරන පාර්ශ්වයට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කිරීමට අදහස් කරන පාර්ශ්වය විසින් වාර්තාවේ හෝ සහතිකයේ පිටපතක් සහ එය ඉදිරිපත් කිරීමට තමන් අදහස් කරන බවට සාධාරණ දැනුම් දීමක්, එම වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ යම් පාර්ශ්වයකට විරුද්ධව ද, ඒ පාර්ශ්වයට දී ඇත්නම් මිස, එම වාර්තාව හෝ සහතිකය සාක්ෂි ලෙස නොපිළිගත යුතු ය.

බලය ලත් නිලධරයා විසින් තමා වෙත තබා ගත් සැම්පලයේ කොටස, අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු බව.

15. (1) බලය ලත් නිලධරයකු විසින් ලබා ගන්නා ලද සැම්පලයක් ඔහු විසින් කොටස්වලට බෙදීමට අවශ්‍ය වන අවස්ථාවක දී, ඉන් එක් කොටසක් තමා වෙත තබා ගත යුතු අතර, එම සැම්පලය සම්බන්ධයෙන් නඩු පැවරීම් කරන අවස්ථාවේ දී තමා වෙත තබා ගත් කොටස අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මහේස්ත්‍රාත්වරයා විසින් තම මෙහෙයවීමෙන්ම හෝ තත් කාර්යය සඳහා චෝදක විසින් හෝ චූදිතයා විසින් කරන ලද ඉල්ලීමක් මත, (1) වන උපවගන්තිය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සැම්පලයේ කොටස විශ්ලේෂණය කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා, එම සැම්පලයේ වෙනත් යම් කොටසක් විශ්ලේෂණය කර ඇති හෝ පරීක්ෂා කර ඇති විශ්ලේෂකයකු නොවන අනුමත කළ විශ්ලේෂක වෙත හෝ අතිරේක අනුමත කළ විශ්ලේෂකයකු වෙත ඉදිරිපත් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සැම්පලයේ කොටස ඉදිරිපත් කරනු ලැබුවේ යම් විශ්ලේෂකයකු වෙත ද, ඒ විශ්ලේෂක විසින් සැම්පලයේ එම කොටස තමා වෙත ලැබී දින විසි අටක් ඇතුළත තම වාර්තාව හෝ සහතිකය අධිකරණය වෙත යැවිය යුතු ය.

(4) විශ්ලේෂණයේ හෝ පරීක්ෂා කිරීමේ වියදම අධිකරණය විසින් විධානය කළ හැකි පාර්ශ්වය විසින් ගෙවනු ලැබිය යුතු ය.

16. මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කර ඇති අවස්ථාවක දී— පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි.

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරන අවස්ථාවේ දී එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු ව, සාමාන්‍යාධිකාරිවරයකු ව, ලේකම්වරයකු ව හෝ වෙනත් සමාන නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) එම මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, වරද සිදු කරන අවස්ථාවේ දී එම මණ්ඩලයේ සාමාජිකයකු ව සිටි සෑම තැනැත්තකුම,

එම වරද සිදු කරන ලද්දේ තම කැමැත්ත හෝ එකඟත්වය නොමැතිව බවට ද ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සලකා අවස්ථානුගත කරුණු අනුව ඒ වරද සිදු කිරීම වැළැක්වීමට ඔහු විසින් ක්‍රියා කළ යුතු වූ පරිදි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට ද ඔප්පු කළහොත් මිස, ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

17. මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ වෙනත් නීති කටයුත්තක් නොපැවරිය යුතු ය. සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

18. (1) නියම කළ යුතු බවට මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:— නියෝග.

(අ) කෘමිනාශකය ආනයනය කිරීම මේ පනතට හෝ එය යටතේ සාදන ලද යම් නියෝගවලට අනුකූල විය යුතු බවට විධිවිධාන සැලැස්වීමට ;

(ආ) මහජන සෞඛ්‍යයේ යහපත සඳහා හෝ මහජන සෞඛ්‍යයට හානි පැමිණීම වැළැක්වීම සඳහා කෘමිනාශකය පිළියෙළ කිරීමේ, ඇසිරීමේ, ගබඩා කිරීමේ සහ පරීක්ෂණය කිරීමේ ක්‍රම ; හෝ

(ඇ) කෘමිනාශකය විශ්ලේෂණය කිරීම හෝ පරීක්ෂා කිරීම, කෘමිනාශකයේ සැම්පල ලබා ගැනීමේ ක්‍රියාවලිය සහ කෘමිනාශක විශ්ලේෂණය හෝ පරීක්ෂා කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, පළ කරනු ලැබූ දින යෙහි දී හෝ නියෝගයෙහි සඳහන් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැති විය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කර ඇති ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

අර්ථ නිරූපණය

**19.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා" යන්නෙන්, තත් කාලයේ ආණ්ඩුවේ රස පරීක්ෂක ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, ඊට තත් කාලයේ අතිරේක, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂක ධුර දරන තැනැත්තන් ද ඇතුළත් වේ; තවද

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් සංවර්ධන සභාවක්, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම පිණිස යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ.